ආබාධ සහිතව ජීවත් වන්නේද අප සමාජයේම සාමාජිකයන් වේ. එහිදී අප සැලකිලිමත් විය යුත්තේ ඔවුන්ට ඇති ආබාධයන් ඔස්සේ ඔවුන්ව නිර්වචනය වීම වැළැක්වීමටත්, ඔවුන්ව කොන් නොකෙරෙන බවට සහතික වීමටත් වේ. ආබාධ සහිත වූ පුද්ගලයන් හැඳින්වීමේදී වඩාත් යෝග්‍ය යෙදුම් සොයා ගැනීම අවශ්‍ය වන්නේද ඒ හෙයිනි. එහිදී ආබාධ සහිත පුද්ගලයන් හැඳින්වීම උදෙසා පුද්ගල-මූලික භාෂාවක් යොදාගැනීම උචිත නොවන්නේද යන පැනය අප ඇසිය යුතුයි.

1) එසේ නම්, පහත පුවත් වාර්තාවන්හි සඳහන් වන "ආබාධිත" යන්නෙන්, ඔවුන්ව ආබාධය මුල් කර ගනිමින් හැඳින්වෙන්නේ යැයි ඔබ සිතන්නේද?

2) ඔවුන්ගේ ආබාධය ප්‍රථම කර නොගනිමින්, පුද්ගලයාව ප්‍රථම කර ගනිමින් හැඳින්වීම සඳහා "ආබාධ සහිත" යන්න වඩාත් උචිත යැයි ඔබ සිතන්නේද?

3) එසේත් නැතිනම්, ඒ සඳහා වඩාත් යෝග්‍ය යෙදුමක් ඔබට යෝජනා කළ හැකිද?

මූලාශ්‍ර:
http://www.aucd.org/docs/add/sa_summits/Language%20Doc.pdf
https://ncdj.org/style-guide/
http://www.disability.wa.gov.au/.../words_that_work_media...

**#MediaEthicsSL #lka #sinhalanews #Aruna #Lankadeepa**